# නැවතත් සාම මගඩිය

නෝර්වේ සාම මගඩිය නැවතත් ආරම්භ වී ඇත. එය අප බලාපොරොත්තු නොවූවක් නො වෙයි. සන්ධානයට ඡන්දය දුන් බොහෝ පිරිසක් එසේ කෙළේ සාම මගඩියට විරුද්ධව නමුදු චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියට ඒ ඡන්දයට වඩා මේ අවස්ථාවේ දී වටින්නේ බටහිරයන්ගේ මේසයෙන් වැටෙන කටු වැනි වූ ඊනියා ආධාර වශයෙන් අපට දෙන ණය ය. බටහිරයන්ගේ ණය නැතිව, ඔවුන් ලබාදෙන රෙදි ක්වෝටා නොමැතිව ආණ්ඩුව පවත්වාගෙන යෑමට හැකි වුවත් කුමාරතුංග මහත්මියට වෙනත් ක්‍රමයක් ගැන විශ්වාසයක් නැත. එබැවින් බටහිරයන්ගේ සාම මගඩියට එකඟවීමට ඇයට සිදුවෙයි. මෙයින් අදහස් කරන්නේ වෙනත් විකල්පයක් නොමැතිකම නිසා කුමාරතුංග මහත්මිය සාම මගඩියට එකඟවන බව නො වෙයි. ඇය කොහොමටත් ප්‍රතිපත්තියක් ලෙස සාම මගඩිය අගය කරයි. ඒ ඇය තම දෙමව්පියන් නිර්මාණය කර ඇති දැඩිකළ  ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නොව තම සැමියා වූ විජය කුමාරතුංග නම් සිංහල බෞද්ධ විරෝධියා නිර්මාණය කළ මහජන පක්ෂයේ ප්‍රතිපත්ති අනුගමනය කරන බැවිනි. සිංහලයන් විශේෂයෙන් ම සිංහල බෞද්ධයන් විශාල පිරිසක් සන්ධානයට ඡන්දය දුන්නේ මහජන පක්ෂයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට නො වෙයි. නෝර්වේ සාම මගඩියට එරෙහිව සන්ධානයේ නායකයෝ විශේෂයෙන් ම ජනතා විමුක්ති පෙරමුණේ නායකයෝ කතා කළහ. තමන් බලයට පත් වී ඇත්තේ කාගේ ඡන්දයෙන් ද යන්න සන්ධානයේ නායක නායිකාවන්ට නැවත නැවතත් මතක් කරදිය යුතුව ඇත.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වටා එක් රොක් වී සිටින ඊනියා බුද්ධිමතුන්, නීතිඥයන් වැනි පිරිස් සාම මගඩියට උපකාරකරන බව රහසක් නො වෙයි. මාක්ස්වාදයෙන් ලබාගත් ජාතික විරෝධී අදහස් ඇති මේ පිරිස් දන්නා එකම දෙය බටහිර මතිමතාන්තර ගිරවුන් මෙන් පුනරුච්චාරණයකිරීම පමණකි. බුද්ධිමතුන් නොවන මේ උගත්තු හා රාජ්‍ය නොවන සංවිධානවල වැටුප් ලබන දීන උගත්තු එක වල්ලේ පොල් වෙති. සාමය ගැන කතාකරන මොවුන් නගන ප්‍රධාන ම තර්කය නම් යුද්ධයෙන් මේ ප්‍රශ්නය කෙළවර කළ නොහැකි බවත් මානව හිතවාදීන් ලෙස යුද්ධයට විරුද්ධ විය යුතු බවත් ය. බටහිරයන් කිසි දිනෙක යුද්ධයට වියුක්ත ව විරුද්ධ වී නැත. යුද්ධයෙන් මිනිසුන් මැරෙන්නේ ය, ළමුන් අනාථවන්නේ ය කියමින් බටහිරයෝ යුද්ධයට විරුද්ධ නො වෙති. අද බටහිරයන් ඉරාකයේ කරගෙන යන්නේ මානව හිතවාදී යුද්ධයක් නො වෙයි. ඉරාකයේ යුද සිරකරුවන්ට එරෙහිව කර ඇති ප්‍රචණ්ඩ ක්‍රියා ගැන නිකම්ම නිකම් සමාවක් ගෙන පැන යෑමට සුද්දෝ ක්‍රියා කරති. සමාව ආදිය නිකම්ම නිකම් වචන පමණක් වන බවත් ඉන් කිසිවකුටවත් අබමල් රේණුවක තරම් දඬුවමක් අත් නොවන බවත් නොදන්නෝ වෙත් ද? සමාව දීම දේව ගතියක් වන්නේ දැයි නොදනිමි. එහෙත් සමාව ගැනීම නම් දේව ගතියක් යැයි නොසිතමි.

දෙමළ ජාතිවාදීන් ආයුධ අතට ගෙන ඇත්තේ කුමක් සඳහා ද? දෙමළ ජනයාට දෙමළ වීම නිසා ම සිදුවන අසාධාරණයක් නැත. දෙමළ ජාතිවාදීන්ට ඇත්තේ එකම එක අරමුණක් පමණකි. එනම් මෙරට සිංහලත්වයට හිමි තැන අහිමිකිරීම ය. එහි දී ඔවුන්ට බටහිරයන්ගේ ආධාරය හා ආශිර්වාදය හිමිවන්නේ සිංහලත්වයට හිමි තැන ලබා දීම බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික යටත්විජිතවාදයට එරෙහිව යන ජාතික අරගලයක කොටසක් නිසා ය. බටහිරයන් දෙමළ ජාතිවාදය බිහිකර පෝෂණයකර රැකගන්නේ ම එය යටත්විජිත විරෝධී අරගලයට එරෙහිව යොදාගත හැකි අවියක් වන බැවින් ය. ඉරාකයේ යුද්ධකරන, පලස්තීනයේ අවුරුදු දෙදහසකට ඉහත යුදෙව්වන්ට තිබූ භූමියක් ඒ කාලය තුළ එහි ජීවත් වූ පලස්තීනුවන්ගෙන් කොල්ලකා යුදෙව්වන්ට අත්කර දීමට කරන යුද්ධයට ආධාරකරන, බටහිරයන් යුද්ධයට විරුද්ධ නැත. ඔවුන් විරුද්ධවන්නේ ඔවුන් වෙනුවෙන් දෙමළ ජාතිවාදීන් ආයුධ සන්නද්ධව ගෙන යන සටන පරාජයකිරීමට ය. නෝර්වේ රාජ්‍යය දෙමළ ජාතිවාදයටත් විශේෂයෙන් ම කොටි සංවිධානයටත් පක්ෂපාති බවට දැන් වුවමනාවටත් වඩා සාක්ෂි ඇත. නෝර්වේ රාජ්‍යය කොටින්ට උපදෙස් දෙන බවටත් දැන් හෙළි වී ඇත. සන්ධානය මැතිවරණයට පෙර නොර්වේ රාජ්‍යයේ මේ ක්‍රියා ගැන කතා කෙළේ ය. අද ඔවුන් ඒ නෝර්වේ රාජ්‍යයට ම නැවතත් තම සාම මගඩිය කරගෙන යෑමට ඉඩ දී ඇත්තේ බටහිරයන්ගේ ආර්ථික සම්බාධකවලට බියෙන් ද?

අපේ ආර්ථිකය බටහිරයන්ට හා බටහිරයන් ම වැනි වූ ජපනුන්ට අවශ්‍ය අන්දමට මෙහෙයවිය හැකි බව රහසක් නො වෙයි. ආර්ථික සම්බාධක යනුවෙන් අමුතුවෙන් යමක් පනවන්නේ නැතිව වුව ද රෙදි ක්වෝටාව අඩුකිරීමෙන් ණය නොදීමෙන්  ආදී වශයෙන් අප හිරකරන්නේ කෙසේ දැයි බටහිරයෝ දනිති. මැතිවරණයට පෙර ඒ ජා පාක්ෂිකයන්

© Prof. Nalin De Silva

දිගින් දිගට ම කියා සිටියේ මේ කරුණ ය. එනම් නෝර්වේ සාම මගඩිය අත්හැරියහොත් සන්ධානයට බටහිර ආධාර නොලැබෙන බව ය. (මේ ආධාර යන වචනය හිස් වචනයක් පමණකි. ඔවුහු අපට ආධාර නොකරති. ඔවුහු අපට ණය දෙති. ඒ ණය අප ගෙවිය යුතු ය. අනෙක් අතට ඔවුහු අප හිරකරන ආකාරයේ ආර්ථික යෝජනා ක්‍රියාත්මක කිරීමට අපට උපදෙස් දෙති. මේ සියල්ලෙහි ප්‍රතිඵලය අප බටහිරයන්ගේ අතෙහි නැටවෙන රූකඩ බවට පත්වීම ය.) එහෙත් සන්ධාන ආණ්ඩුව බලයට පත් වී සතියක් ගතවීමට ද මත්තෙන් ඇමතිවරු ආධාර ලැබෙන බවට උදම් ඇනූහ. එයින් පැහැදිලි වූයේ අළුත් ආණ්ඩුව නෝර්වේ ද ඇතුළු බටහිරයන් සමග යම් එකඟත්වයකට පැමිණ ඇති බව ය.

මෙයින් පෙන්නුම් කෙරෙන්නේ මෙරට බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදය ක්‍රියාත්මක කෙරෙන ආකාරය ය. ජාතික ව්‍යාපාරයකට යටත්විජිතවාදයට විරුද්ධ නොවී ක්‍රියාත්මක වීමට නො හැකි ය. අනෙක් අතට මෙහි දී තවත් කරුණක් කෙරෙහි අපේ අවධානය යොමු විය යුතු ය. අද දවසේ යටත්විජිතවාදයට විරෝධී ව්‍යාපාරයක් ජාතිකත්වයකින් තොරව ක්‍රියාත්මක නොකළ හැකි ය. බටහිර යුදෙව් ක්‍රිස්තියානි සභ්‍යත්වයෙහි ම නිර්මාණයක් වූ කසිකබල් මාක්ස්වාදයට තවදුරටත් බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයට විරුද්ධ ව ක්‍රියාත්මක විය නො හැකි ය. එමෙන් ම ජාතික ව්‍යාපාරයකට බටහිර ආර්ථික ක්‍රමයට විකල්ප ආර්ථික ක්‍රමයක් ද තිබිය යුතු ය. ඒ සියල්ලටමත් වඩා ජනතාව ඒ කරුණුවලට එකඟවිය යුතු ය. බඩ පිනවීම පරමාර්ථය කරගත් මධ්‍යම පන්තියකට යටත්විජිතවාදයෙන් ගැලවිය නො හැකි ය.

එහෙත් මේ එකකින්වත් සන්ධාන ආණ්ඩුවේ ප්‍රතිපත්තිය යුක්තියුක්ත නො කෙරෙයි. ඊනියා සාමකතා මුළුමනින් ම පසෙක දැමිය යුතු ය. සාමකතාවල පදනම ම වැරදි ය. මෙරට ඉතිහාසය ගැන මෙලෝ හසරක් නොදන්නා චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය, ඊනියා බුද්ධිමතුන් හා රාජ්‍ය නොවන සංවිධානවල ගැත්තන් කුමක් කීව ද දෙමළ ජනයාට දෙමළ වීම නිසා ම සිදු වී ඇති අසාධාරණයක් නොමැත. අද සිදුවන්නේ බටහිරයන්ගේ අවශ්‍යතාවය මත සිංහල ජාතිකත්වයට එරෙහිව දෙමළ ජාතිවාදීන් විසින් ගෙන යනු ලබන සටනකි. එය යුද්ධයෙන් පරාජය කළ යුතු ය. ඒ සඳහා ජනතාව කැපවිය යුතු ය. එහෙත් ආණ්ඩුවට ස්ථිර කැප වූ ප්‍රතිපත්තියක් නොමැතිව ජනතාවගෙන් කැපවීමක් බලාපොරොත්තු නොවිය හැකි ය. කැප වූ ආණ්ඩුවක් කළ යුත්තේ ඉන්දියාවට චීනයට හා වෙනත් රටවලට ප්‍රශ්නය කුමක් දැයි පැහැදිලි කර දීම ය. තමන්ට එය තර්කානුකූලව සාධක සහිතව කියාගත නොහැකි නම් එය කියා දීමට හැකි අයට ඒ සඳහා ඉඩ දිය යුතු ය. අර කසිකබල් ඊනියා බුද්ධිමතුන්ට නම් එය කිසි දිනෙක කළ හැකි කාර්යයක් නො වෙයි. ඔවුහු බටහිර යටත්විජිතවාදයේ ගැත්තෝ ම වෙති.

ආණ්ඩුවට උපායක් ලෙස හුදු කල් මැරීමක් සඳහා සාකච්ඡා අවශ්‍ය නම් පළමුව කළ යුත්තේ නෝර්වේ රාජ්‍යය සාකච්ඡාවලින් ඉවත්කිරීම ය. දෙවනුව දෙමළ ජනයාගේ එකම නියෝජිතයා ලෙස කොටි සංවිධානය නො පිළිගැනීම ය. කදිරගාමර් මහතා අද කියන්නේ කොටි සංවිධානය ආධ්‍යහාරයෙන් දෙමළ ජනයාගේ එකම නියෝජිතයා වන බව ය. මේ වචන හරඹවලින් සිංහලයන් රැවටිය නො හැකි ය. සාකච්ඡාවල දී මුස්ලිම් ජනයා නියෝජනය වන්නේ නැතැයි හකීම් මහතා කියයි. එහි දී සිංහලයන් නියෝජනය කරන්නේ කවු ද? කදිරගාමර් මහතා ද? මේ ප්‍රශ්නයේ දී සිංහලයන් හුදු නරඹන්නන් පිරිසක් බවට පත්කරගැනීමට ආණ්ඩුව ක්‍රියා නොකළ යුතු ය. එමෙන් ම කිවයුත්තක් ද වෙයි. සිංහලයන් අවස්ථාවාදය හා බලලෝභය තම දේශපාලනය කරගත් පිරිසකට ද නොරැවටිය යුතු ය.

© Prof. Nalin De Silva